සැ. යු.- 2016.03.04 දින පළ වූ අංක 1,957 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,958 - 2016 මාර්තු මස 11 වැනි සිකුරාදා - 2016.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 664 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අප්‍රේල් මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 මාර්තු මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## වයඹ පළාත් සභාව

### වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය

වයඹ පළාත් සභාවේ අනුමත ප්‍රාථමික අර්ධ ශිල්පීය සහ ශිල්පීය බඳවා ගැනීම් පරිපාටියේ ඇතුළත් වයඹ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට 2016.03.25 ට පෙර බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

වයඹ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු තනතුරු :

*ප්‍රාථමික අර්ධ ශිල්පීය බඳවා ගැනීම් පරිපාටියේ ඇතුළත් තනතුරු-*

1. වඩු කාර්මික
2. ජලනල කාර්මික
3. මැහුම් සේවිකා
4. රසායනාගාර සහායක

*ප්‍රාථමික ශිල්පීය බඳවා ගැනීම් පරිපාටියේ ඇතුළත් තනතුරු -*

1. විදුලි කාර්මික

1. සුදුසුකම් :

1. ශ්‍රී ලංකා පුරවැසියෙකුවීම,
2. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් වයඹ පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු වීම,
3. මනා චරිතයකින් හා යහපත් ශරීර සෞඛ්‍යයකින් යුක්ත වීම.

2. අධ්‍යාපන සුදුසුකම් :

*ප්‍රාථමික අර්ධ ශිල්පීය බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් තනතුරු -*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතු ය.

*ප්‍රාථමික ශිල්පීය බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් තනතුරු -*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතු ය. අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 05 ක් සමත් විය යුතු ය.

3. *ශිල්පීය නිපුණතාවය :*

1. වඩු කාර්මික - තනතුරට අදළ වෘත්තීය පිළිබඳව NVQ 2 හෝ NVQ 3 මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබීම.
2. ජලනල කාර්මික - එම
3. මැහුම් සේවිකා - එම
4. විදුලි කාර්මික - තනතුරට අදළ වෘත්තීය පිළිබඳව NVQ 4 මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබීම.

4. පළපුරුද්ද.-

*ප්‍රාථමික අර්ධ ශිල්පීය බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් තනතුරු.—*

එක් එක් වෘත්තියට අදළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය සංස්ථා/මණ්ඩල/ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර 02කට වැඩි කාලයක් සේවය කර තිබීම. (සහතික මගින් සනාථ කළ යුතු වේ.)

*ප්‍රාථමික ශිල්පීය බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් තනතුරු.—*

පිළිගත් ආයතනයක අදළ ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්දක් තිබීම (සේවා සහතික මගින් සනාථ කළ යුතු වේ.)

5. *වයස් සීමාව.-* 2016.03.25 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩිවීම.

6. *තෝරා ගැනීමේ ක්‍රමය :*

*ප්‍රාථමික අර්ධ ශිල්පීය බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් තනතුරු.—*

අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් පසුව සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

*ප්‍රාථමික ශිල්පීය බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් තනතුරු.—*

අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් පසුව වෘත්තීය සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුස්සන් තෝරාගනු ලැබේ.

7. *වැටුප් පරිමාණය (මාසික).-*

*ප්‍රාථමික අර්ධ ශිල්පීය සහ බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් තනතුරු*

PL 2-2006-ඒ, රු. 12,210-10x130-10x145-10x160-12x170-රු. 18,600/=

*ප්‍රාථමික ශිල්පීය බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් තනතුරු.—*

PL 3-2006-ඒ, රු. 12,470-10x130-10x145-10x160-12x170-රු. 18,860/=

8. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.—*

1. මෙම තනතුර ස්ථිර ය, විශ්‍රාම වැටුප් සහිත ය.
2. පත්වීම වසර තුනක පරිවාස කාලයකට යටත් වේ.

9. *අයදුම් කිරීම :*

i. පහත දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව සකස් කරගත් අයදුම්පතක් 2016.03.25 දිනට හෝ එදිනට පෙර ''ලේකම්, වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය, 3 වන මහල පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ii. අසම්පූර්ණ, සුදුසුකම් රහිත හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ.

iii. අයදුම්පත් බහාලූ කවරයේ වම් පස උඩ කෙලවරේ තමා අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු අතර, එක් එක් තනතුරට අදළව වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

10. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය.*— වයඹ පළාත් ප්‍රාථමික අර්ධ ශිල්පීය සහ ශිල්පීය බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් විධිවිධාන අනුව මෙම බඳවා ගැනීම් සිදුකරනු ලැබේ. තනතුරට අදළව බඳවා ගැනීම් පරිපාටිවල ඇතුළත් අනෙකුත් විධිවිධාන එලෙසම බල පවත්වනු ලැබේ.

ටී. බී. වික්‍රමසිංහ,
ලේකම්,
වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය,
සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා,
කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය.

2016 පෙබරවාරි මස 19 වැනි දින,
වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය,
3 වන මහල,
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය හා අර්ධ ශිල්පීය සේවක ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම*

01. ඉල්ලුම්කරන තනතුර :————.

02. පෞද්ගලික තොරතුරු :

2.1 මුලකුරු සමග නම :————.

2.2 සම්පූර්ණ නම :————.

2.3 පෞද්ගලික ලිපිනය :————.

2.4 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

2.5 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

2.6 වයඹ පළාතේ ස්ථිර පදිංචිය :————.

2.7 ස්ත්‍රී පුරුෂ භාවය :————.

2.8 විවාහක/අවිවාහක බව :————.

2.9 ජන වර්ගය :————.

2.10 ජාතික හැඳුනුම්පත් අංකය :————.

2.11 උපන් දිනය :————.

2.12 දුරකථන අංකය :————.

03. අධ්‍යාපන සුදුසුකම් :————.

04. ශිල්පීය නිපුණතාවය :————.

05. සේවා පළපුරුද්ද :————.

06. වෙනත් සුදුසුකම් :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

03-251